# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2182/12 - 2020 ජුනි මස 30 වැනි අඟහරුවාදා - 2020.06.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 57 වැනි වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති.

**මහාචාර්ය එන්. ටී. සොහාන් විජේසේකර,**
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,
(සඳහා හා වෙනුවෙන්)
සභාපති.

2020 ජුනි මස 19 වැනි දින දී ය.

**රීති**

1. මේ රීති 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (කොන්ත්‍රාත්කරුවන් නියාමන ක්‍රමවේදය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් නියාමනය කිරීම සඳහා නියාමන ක්‍රමවේදයක් පැවතිය යුතු ය.

3. එකී පනත යටතේ ලියාපදිංචි සෑම කොන්ත්‍රාත්කරුවකුම, භෞතික, සාමාන්‍ය හෝ වෙබ් ජාලගත නියාමන ක්‍රමවේදයක් ලෙස පවත්වාගෙන යනු ලැබිය යුතු වන 2 වන රීතිය යටතේ පිහිටුවනු ලැබුවා වූ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නියාමන ක්‍රමවේදයට අනුකූල විය යුතු ය.

4. එකී පනත යටතේ ලියාපදිංචි සෑම කොන්ත්‍රාත්කරුවකුම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් භෞතිකව නියාමනය කිරීම සඳහා දිවා කාලය තුළ වැඩබිම් වෙත පැමිණ නිරීක්ෂණය කිරීමට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිලධරයන්ට පහසුකම් සැලසිය යුතු ය.

5. එකී පනත යටතේ ලියාපදිංචි සෑම කොන්ත්‍රාත්කරුවකුම, යම් ගිවිසුමක, අවස්ථාවෝචිත පරිදි, සෑම උපදේශකවරයකුම හෝ ඉංජිනේරුවරයකුම සහ අදාළ සේවා යෝජකයකුම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වෙබ් ජාලගත නියාමන ක්‍රමවේදයට ප්‍රවේශ වීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

6. සේවායෝජකයා, උපදේශකවරයා, ඉංජිනේරුවරයා හෝ කොන්ත්‍රාත්කරු ඇතුළු ගිවිසුමක සියලු පාර්ශවයන්ගේ යෙදවුම්, අදහස්, ප්‍රතිචාර සියල්ලක්ම නියාමන ක්‍රමවේදයෙහි දී භාවිත කළ යුතු ය. එකී යෙදවුම්, අදහස්, ප්‍රතිචාර යනාදිය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සාමාන්‍ය, භෞතික සහ වෙබ් ජාලගත නියාමන ක්‍රමවේදය මගින් රැස් කරනු ලැබිය යුතු ය.

7. කොන්ත්‍රාත්කරුවකු ප්‍රමාණනය කිරීමේ කාර්යය සඳහා, කොන්ත්‍රාත්කරුවකුගේ කාර්යය සාධනය -

(අ) කාර්යයේ ගුණාත්මකභාවය ;

(ආ) ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය ;

(ඇ) පිරිවැය කළමනාකරණය ;

යනාදිය මත පදනම්ව වාර්ෂිකව ඇගයිය යුතු ය.

07 - 394